# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2456/78 - 2025 ඔක්තෝබර් මස 04 වැනි සෙනසුරාදා - 2025.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2020/WS/238.
*මගේ අංකය* : RUW/LAN/ACQTN/A2/264.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*මහජන කටයුත්ත කුමක් ද යන වග* :- රුවන්වැල්ල ජල යෝජනා ක්‍රමය යටතේ ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:-*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිගම්පල් කෝරළේ, අංක 104B මාහල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙවෙක්කන්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 610445හි කලාප අංක 05, පත්‍ර අංක 1 හා 2025.08.06 දිනැති පිඹුරේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1012 ක් වූ පහත සඳහන් කැබලි අංක 1 දරන බිම් කැබැල්ල :-

**01.** කැබලි අංකය **1**

ඉඩමේ නම: රුවන්වැල්ල වත්ත, මුල් හිමිකම් පාන්නා සීමාසහිත මල්වත්ත වැලි වැවිලි සමාගම; ප්‍රමාණය: හෙක්. 0.1012.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනා ම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2026 පෙබරවාරි මස 18 වැනි දින පෙ. ව. 09.30** ට රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2026 පෙබරවාරි මස 02** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/පරවශතාව සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතු ය.

**එච්. ඩී. එස්. එන්. හෙට්ටිගේ,**
ප්‍රාදේශීය ලේකම්,
රුවන්වැල්ල.

2025 සැප්තැම්බර් මස 30 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0054




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*